ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**මැයි 2017**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 මැයි මාසයේ දී 57.9 ක දර්ශක අගයක් වාර්තා කරමින්, 2017 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 16.1 කින් ඉහළ යන ලදී. ඒ අනුව, අප්‍රේල් මාසයේ දක්නට ලැබුනු සෘතුමය පහළ යෑමෙන් පසුව නිෂ්පාදන ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පැමිණ ඇති බව පිළිබිඹු **වේ. මෙම ඉහළ යෑම** සඳහා ප්‍රධාන වශයෙන් නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකයන්ගේ ඉහළ යෑම හේතු විය**.** තවද, සේවා නියුක්තිය උප දර්ශකය හැර අනෙකුත් සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී**.** එසේ නමුත්**,** මෙම මාසයේ 25 වන දින සිට පැවැති අයහපත් කාළගුණික තත්ත්වය හේතුවෙන් සේවකයන්ගේ නොපැමිණීම සහ ඇණවුම් සැපයීමට සැපයුම්කරුවන්ට වැඩි කාලයක් ගතවීම හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාකාරකම්හි බලාපොරොත්තු වූ වර්ධනය යම්තාක් දුරට පසුබෑමකට ලක්විය**.** කෙසේ වුවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 අප්‍රේල් මාසයේ දී වාර්තා වූ 54.2 ක දර්ශක අගයට සාපේක්ෂව මැයි මාසයේ දී, 55.3 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. සේවා අංශයෙහි පෙන්නුම් කරන මෙම මධ්‍යස්ථ වර්ධනයට නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ සේවා නියුක්තිය හේතු විය. 2017 අප්‍රේල් මාසයේ දී සේවා නියුක්තියෙහි දක්නට ලැබුණු අඩුවීමෙන් පසු, මැයි මාසයේ දී එය නැවත වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. අහිතකර කාලගුණික තත්ත්ව සහ උත්සව සමය අවසන් වීම හේතු කොට ගෙන මැයි මාසයේ දී අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය අඩු විය. නිම කිරීමට ඇති කාර්යයන්, සමීක්ෂණය ආරම්භයේ සිටම නිරීක්ෂණය කළ නැඹුරුව පවත්වාගෙන යමින් අඩුවීමක් පෙන්නුම් කළේය. 2017 අප්‍රේල් මාසයට සාපේක්ෂව මැයි මාසයේ දී අය කරන මිල ගණන් උප දර්ශකය, ඉල්ලුමෙහි අඩුවීමත් සමගම පහත යාමක් පෙන්නුම් කෙරිණි. මේ අතර අප්‍රේල් මස සිදුකළ වාර්ෂික වැටුප් වර්ධකවලින් පසුව 2017 මැයි මාසයේ දී, අපේක්ෂිත ශ්‍රම පිරිවැය දර්ශකය අඩු විය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | 2016 | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | 2017 | 56.2 | 57.1 | 66.5 | 41.8 | - | - | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | 2016 | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | 2017 | 57.5 | 57.3 | 60.8 | 54.2 | - | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.